# ජාත්‍යන්තර මුහුදේ ධීවර කර්මාන්තය

## පිළිබඳව ඔබ දත යුතු දේ...



(නව තාක්ෂණය, නීති රීති හා සම්ප්‍රදායයන්)

# අන්තර්ගතය


පෙරවදන

1.0 ජාත්‍යන්තර ධීවර කටයුතු පාලනය කිරීමේදී ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කරනු ලබන කළමනාකරණ පද්ධතිය හා එහි අවශ්‍යතාවය

2.0 ජාත්‍යන්තර ධීවර කටයුතු පිළිබඳව අදාලවන අන්තර්ජාතික ගිවිසුම් හා සම්මුතීන්

3.0 ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු කරන ශ්‍රී ලංකා ධීවර ධජය රැගත් ධීවර යාත්‍රා වල වගකීම

4.0 නීති උල්ලංඝනය හා දඬුවම්

5.0 විශේෂ අනතුරු හැඟවීමක්

6.0 මහ මුහුදේ ධීවර කටයුතු කළමනාකරණය සඳහා යොදා ගන්නා ප්‍රධාන මෙවලම්

6.1 ධීවර දත්ත සටහන් පොත - Log Book

6.2 යාත්‍රා පරීක්ෂණ ක්‍රියාවලිය - Vessel/ Landing Inspection

6.3 යාත්‍රා නිරීක්ෂන පද්ධතිය Vessel Monitoring System (VMS)

7.0 ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතුවල යෙදිමෙදී පිළිපැදිය යුතු මුලික කරුණු සැකෙවින්

# පෙරවදන

අනාදිමත් කාලයක සිට අපි විවිධත්වය මෙන්ම ගුණාත්මක අගය වැඩි මසුන් සපයන ධීවර කර්මාන්තයක යෙදුනෙමු. අපගේ මුතුන්මිත්තන් හැම විටම යහපත් හා පරිසර හිතකාමී ධීවර ක්‍රමවල යෙදුනහ. අනාගත පරපුරට එනම් වර්තමානයේ අපට ධීවර සම්පත් ඉතුරු කර දීමට ඔවුන් සෑම විටමකටයුතු කලහ. ඔවුන් භාවිතා කලේ එකල තිබු හොඳම තාක්ෂණයයි.

**එහෙත්** අද අපට පාලනය කල නොහැකි විවිධ හේතූන් නිසා මසුන් සම්පත් වඳ වී යමින් පවතී. මෙය ලංකා ජලතීරයට පමණක් සීමා වුවක් නොව මුලු ලොව පුරාම දක්නට ලැබෙන ප්‍රවණතාවයකි.**වගකීමකින්තොරව සිදු කරන ධීවර කටයුතු දිගටම සිදු වුවහොත් 2048 දී පමණ සියලුම ධීවර කර්මාන්ත අභාවයට යනු ඇත.**

නිසිසේ කළමනාකරණය කරන ලද ධීවර කර්මාන්තයක් දේශීය වශයෙන් පමණක් නොව අන්තර්ජාතික මට්ටමෙන්ද ඇතිකල යුතු බව අන්තර් ජාතික ප්‍රජාව පිලිගන්නා අතර ඒ සඳහා ජගත් සාගර නීතිය යටතේ සම්මුති ගණනාවකට එලැඹී ඇත. මෙම සම්මුතියන් නිසා තහනම් ආම්පන්න භාවිත නොකිරීම, ජාත්‍යන්තරය එකගවු නීති රාමුවක ක්‍රියා කිරීම හා අල්ලා ගන්නා මසුන් ප්‍රමාණය නිවැරදිව වාර්තා කිරීම ආදී වගකීමකින් මසුන් මැරීමේ ක්‍රියාවලියන් එලි දැක්වී ඇත.

එබැවින් අප හැම නැවතත් අපගේ මුතුන්මිත්තන් ලෙස වගකීමෙන් ක්‍රියාකලයුතු කාලය එලැඹ ඇත. ජාත්‍යන්තර

නීති සකස්වී ඇත්තේද මසුන් සම්පත් රැක ගැනීමේ උවමනාවෙනි. රටක් ලෙස අප ඒවාට එකගවී ඇත්තෙමු. ඒ නීති රාමුවට පිටින් යාමේ ප්‍රතිවිපාක නිසා පෞද්ගලිකව අපට වඩා රටට සිදු වන පාඩුව සහ අවමානය අති මහත්ය. වර්තමානයේ අප ඒ අතිදැකීමට මුහුණ දී ඇත්තෙමු.

යුරෝපා සංගමය විසින් අප මත්ස්‍ය අපනයන අවස්ථාවට බාධා පැනවීම, මසුන් අපනයනයේ යෙදෙන සමාගම් කිහිපයකට හෝ එම සමාගම් වලට මසුන් සපයන ධීවරයින්ට හෝ පමණක් සිදුවූ පාඩුවක් නොව පොදුවේ ලංකාවේ අප සැමට සිදුවූ පාඩුවකි. යුරෝපා තහනමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ශ්‍රී ලංකාව විසින් නීති විරෝධී, වාර්තා නොකරන සහ අවිධිමත් ධීවර කර්මාන්තය මැඩලීම සඳහා ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව ප්‍රමාණවත් ලෙස පියවරක් නො ගැනීමයි. දැන් මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් පියවර රාශියක් ගෙන ඇත.

අන්තර්ජාතික ධීවර කටයුතු පිලිබඳ ශ්‍රී ලාංකික **නීතිය** හා දඬුවම් දැඩි කිරීම හා ඒවා පිලි පැදීම, අන්තර්ජාතික ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රාවල යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය අනිවාර්යයෙන්ම සවිකිරීම, එම යාත්‍රාවල (ලොග් පොත්) රැගෙන යාම හා දත්ත නිසි පරිදි සම්පූර්ණ කර භාරදීම, යාත්‍රා පරීක්ෂණ ප්‍රමාණය වැඩි කිරීම හා යාත්‍රා පරීක්ෂණ වලදී හෙලිවන වැරදි වලට නොපමාව දඬුවම් ලබාදීම සහ යාත්‍රාවල නිරීක්ෂකයින් යෙදවීම යන විවිධ ක්‍රියාවලියන් හරහා වගකීමෙන් යුතුව ධීවර කර්මාන්තයේ යෙදිම හා වෙනත් පාර්ශව වල අයිතිවාසිකම් සුරැකෙන සේ වැඩ කිරිම සනාථ වෙයි.

එසේ වුවහොත් ඔබ ඔබේ අනාගත පරපුර වෙනුවෙන්, රට වෙනුවෙන් හා අවසානයේ ලෝකයේම මත්ස්‍ය සම්පත් වෙනුවෙන් ඔබේ ධීවර වගකීම ඉටුකල අයෙකු ලෙස අපේ මුනුපුරු මිනිබිරියන් හා සමතැන් ගනු ඇත.

**එමෙන්ම වර්ෂ 2048 දී අනාගත පරපුරේ සුසුම් වලට ඔබ වග නොකියන්නෙකු වනු ඇත.**

වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් උදෙසා



## 1.0 ජාත්‍යන්තර ධීවර කටයුතු පාලනය කිරීමේදී ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කරනු ලබන කළමනාකරණ පද්ධතිය හා එහි අවශ්‍යතාවය

වර්ෂ **2013** වන තෙක් ශ්‍රී ලංකා ධීවර නීති පද්ධතියේ ඇතුලත් ප්‍රතිපාදන බලපෑවේ හුදෙක්ම ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය ඇතුලත සිදු කෙරුණු ධීවර කටයුතු සම්බන්ධයෙනි. පසුගිය දශක දෙක තුල බහු දින ධීවර යාත්‍රා ගහණයක් බිහිවීම හා ඒවා ශ්‍රී ලංකා ආර්ථික අනන්‍ය කලාපයට ඔබ්බෙන් පිහිටි ජාත්‍යන්තර මුහුදු කලාපවල ධීවර මෙහෙයුම් කිරීමේ පසුබිම යටතේ, ජාත්‍යන්තර මුහුදේ ශ්‍රී ලංකා යාත්‍රා මගින් කරන ධීවර කටයුතු කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවයක් මතුවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ජගත් සාගර නීතිය (Law of the see conflation) පදනම් කොටගත් ජාත්‍යන්තර නීති ගණනාවකටම ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වීමයි.

එම ජාත්‍යන්තර නීති හා ගිවිසුම්වල අන්තර්ගත ප්‍රතිපාදනවලට අනුකූලව ශ්‍රී ලංකා ධීවරයින් කටයුතු කරන බවට සහතික වීම ශ්‍රී ලංකාවේ ඉමහත් වගකීමකි. මේ අන්තර්ජාතික නීති හා ගිවිසුම් අතර ප්‍රධාන වන්නේ,

- ජගත් සාගර නීතිය **1982**
- එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග පිළිබඳ සම්මුතිය 1995, හා
- ඉන්දීය සාගර ටූනා කොමිසම 1996
- ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අනුකූලතා ගිවිසුම 1993
- ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වරාය රාජ්‍ය ගිවිසුම 2009


- ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වගකීම් සහිත ධීවර කටයුතු පිළිබද ආචාර පද්ධතිය (1995) යනාදියයි.

මෙම නීති සංග්‍රහයන් හාගිවිසුම්වල ඇති ප්‍රතිපාදන හා දැනට ශ්‍රී ලංකාවේ මසුන් සඳහා වන විශාලතම වෙළඳපොල වන යුරෝපා කොමිසමේ අවශ්‍යතාවලට අනුකූලත්වය දැක්වීම සඳහා 2013 අංක 35 දරණ සංශෝදන පනත මගින් 1996 අංක 2 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සංශෝදනය කරන ලදී.

## 2.0 ජාත්‍යන්තරධීවර කටයුතු පිළිබඳව අදාලවන අන්තර්ජාතික ගිවිසුම් හා සම්මුතීන්

### 2.1 එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS)

වර්ෂ 1982 දී මුහුදු නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ජගත් සම්මේලනය විසින් අනුමත කරන ලද ජගත් සාගර සම්මුතියට අනුව සියලුම වෙරළබඩ රටවලට නා.සැ. 200ක අනන්‍ය ආර්ථික කලාපයක්බිහිකර ගැනීමට අවස්ථාව උදාවිය.නා.සැ. 200 න් එහා ජාත්‍යන්තර මුහුදවශයෙන් සැලකෙන අතර එම ප්‍රදේශයේ සම්පත් ලෝකයේ සෑම රටකටම ප්‍රයෝජනයට ගත හැකි පොදු සම්පත් වශයෙන් සැලකේ.




ශ්‍රී ලංකාව සතු අනන්‍ය ආර්ථික කලාපයේ මායිම්

## 2.2 එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොගපිළිබඳ සම්මුතිය (UNFSA)

මෙම සම්මුතිය මගින් එක්සත් ජාතීන්ගේ සාගර නීතියට අනුකූලවජාත්‍යන්තර මුහුදේ ඇති ජීවී සම්පත් (මසුන් ) තිරසාර ලෙස නෙලාගැනීමට අවශ්‍ය උපදෙස් සපයයිමෙමගින්,

- කලාපීය සහයෝගීතාවය දියුණුකර ගැනීම
- ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු සඳහාමෙහෙයුම් බලපත්‍ර ලබාදීම
- වෙනත් රටවල මුහුදු සීමාවන් තුල මසුන් ඇල්ලීම තහනම් කිරීම
- දත්ත රැස් කිරීම සඳහා ලොග් පොත හා VMS යොදා ගැනීම,
  වැනි දේ සඳහන් කෙරේ,

## 2.3 ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOTC)

(ටුනා යනුවෙන් හඳුන්වනු ලබන්නේ බලයින්, කෙලවල්ලන්, වැනි වර්ග වලට අයත් මසුන්ය)

IOTC යනු 1996 ඉන්දියන් සාගරය ආශ්‍රිත රටවල හා ඉන්දියන් සාගරයේ ධීවර කටයුතු කරන,

- සාමාජික රටවල් අතර සහයෝගීතාව තහවුරු කිරීම
- සහකළමනාකරණය තුලින් මත්ස්‍ය සම්පත සංරක්ෂණය කිරීම
- ධීවර කර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම
- මත්ස්‍ය තොග සංරක්ෂණය, පර්යේෂණ කළමනාකරණය සඳහා වන කොන්දේසි හා මගපෙන්වීම් සිදු කිරීම
- නව තාක්ෂණය හඳුන්වාදීම, පුහුණු පාඨමාලා පැවැත්වීම

ඉන්දියන් සාගර කලාපය තුල ප්‍රශස්ථ පරිභෝජන මට්ටමක් පවත්වාගෙන යාමේ අරමුණඇතිව පිහිටුවා ගන්න ලද කලාපිය ධීවර කළමනාකරණ සංවිධානයයි. ශ්‍රී ලංකාව මෙහි ආරම්භක සාමාජිකයෙකි.

## 3.0 ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු කරන ශ්‍රී ලංකා ධීවර ධජය රැගත් ධීවර යාත්‍රා වල වගකීම

ධීවර කටයුතු පිළිබඳ ජත්‍යාන්තර නීති හා ගිවිසුම් කීහිපයකටම අත්සන් කිරීමෙන් දායක වු රාජ්‍යයක් හැටියට, ශ්‍රී ලංකාව එම නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරිමට බැදී සිටී. ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු කරන සියලුම ධීවර යාත්‍රා ජාත්‍යාන්තර නීතියට අනුකූලව කටයුතු කිරීම අනිවාර්ය වේ. මෑත කාලවලදී මෙසේ ක්‍රියා නොකිරීම නිසා පොදුවේ ශ්‍රී ලංකා ආර්ථිකයටත්, ධීවර ජනතාවටත්, විශාල අගතියකට මුහුණදිමට සිදුවිය.

2015 මුල දී සිට ශ්‍රී ලංකා මසුන් අපනයනය කිරීමේ විශාලම හා ඉතාම ලාභදායි වෙළෙඳපොල වන යුරෝපා සංගමයේ රටවලට ශ්‍රී ලංකා මසුන් අපනයනය කිරීමේ තහනමකට ලක් වී සිටියි.

විශේෂයෙන්ම මෙම පසුබිම යටතේ, ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු කරන සියලුම ශ්‍රී ලංකා ධීවර යාත්‍රා අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු නීති රීති 1996 අංක 2 ධීවර හා ජලජ සම්පත් පනත හා 2013 අංක 35 දරණ ධීවර හා ජලජ සම්පත් පනත හා 2013 අංක 35 දරණ ධීවර හා ජලජ සම්පත් (සංසෝදන) පනත යටතේ දක්වා ඇත.

එයින් ප්‍රධානතම අවශ්‍යතාව වන්නේ ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු සඳහා ධීවර මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගැනීමයි.

**3.1 ජාත්‍යාන්තර මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර ලබා ගැනීම සඳහා වන නිර්නායක**

- යාත්‍රාව ලියා පදිංචිය ලබාගත් මීටර 10.3ට වඩා විශාල යාත්‍රාවක් විය යුතුය
- මෙහෙයුම් බලපත්‍රය අලුත් කිරීමේ දී පෙර ගමන්වාර සඳහා සම්පූර්ණ කරන ලද ලොග් සටහන් ඉදිරිපත් කොට ජාත්‍යාන්තර මුහුදු ධීවර කටයුතු සඳහා බලපත්‍රයක් ලබා සිටිය යුතුය
- යාත්‍රා නියමුවාට(කපිතාන්) ධීවර දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන නියමු බලපත්‍රයක් තිබිය යුතුය.
- යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) උපකරණ,එස්.එස්.බී.රේඩියෝව යාත්‍රාවේ තිබිය යුතුය.
- ඇමතුම් සංකේතයක් (Call Sign) විදුලි සන්දේශ නියමන කොමිසම වෙතින් ලබා ගතයුතුය.
- අදාල රෙගුලාසියට අනුකූලව ආම්පන්නත් සලකුණු කර තිබිය යුතුය.

**3.2 ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු සඳහා අනිවාර්ය වන විශේෂ කොන්දේසි හා අවශ්‍යතා:**

- මෙහෙයුම් බලපත්‍රයක් රහිතව ජාත්‍යාන්තර මුහුදු ධීවර කටයුතුවල යෙදීම තහනම් **බව සැලකිය යුතුය.**

- යාත්‍රාවේ ලියා පදිංචි සහතිකය, නියමු බලපත්‍රය, ධීවර මෙහෙයුම් බලපත්‍රය හා ධීවර දත්ත සටහන් පොත ( ලොග් පොත) හැම වීටම යාත්‍රාවේ තිබිය යුතු අතර, බලය ලත් නිලධාරියෙකු ඉල්ලා සිටින ඕනෑම විටක ඒවා **ඉදිරිපත් කළ යුතුය.**

- යාත්‍රාව ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රාකළ යුතු අතර රටේ නම, ලියා පදිංචි අංකය බෝට්ටුවේ බදේ පැහැදිලිව **සටහන් කළ යුතුය.**

- ❖ යාත්‍රාව ධීවර මුහුදු ගමනක් සඳහා පිටත්වීමට පෙරත්, පෙරලා වරායට ආ විගසත්, ඒ පිළිබඳව වරාය කළමණාකරු වෙත **වාර්තා කළ යුතුය.**

- ❖ යාවත් කාලීන කරන ලද **ලොග් සටහන් පොත** පවත්වාගෙන යුතු අතර , එහි සඳහන් තොරතුරු වල සත්‍ය හා නිවැරදිතාව නියමුවා විසින් සහතික කොට වරායට ආපසු ලගාවූ විට බලය ලත් නිලධාරි වෙත ලොග් සටහන් පොතේ **මුල් පිටපත භාර දිය යුතුය.**

- ❖ ආම්පන්න සලකුණු කිරීමේ රෙගුලාසියට අනුකූලව ධීවර ආම්පන්න වල අනන්‍යතාව තහවුරු කිරීම සඳහා යාත්‍රාවේ ලියා පදිංචි අංකය , යාත්‍රාවේ නම, ඇමතුම් සංකේතය, යාත්‍රා හිමිකරුගේ හා නියමුවාගේ නම, ලියා පදිංචිකළ වරාය යනාදිය සලකුණු කළ යුතුය

## 3.3 ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන ශ්‍රී ලංකා ධීවර බෝට්ටු විසින් අනිවාර්යෙන්ම නොකළ යුතු දේ.

- ❖ වෙනත් වෙරලාසන්න රාජ්‍යයකට අයත් දේශීය ජල තීරයේ නීතිවලට අනුකූලව ධීවර කටයුතු කිරීමට බලය දී ඇත්නම් මිස ඒ ජල තීරවල ධීවර කටයුතු **නොකළ යුතුය.**

- ❖ මුහුදු කෂිරපායින්, කැස්බෑවන්, කස මෝර විශේෂයන් හෝ මුහුදු පක්ෂීන් වැනි තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ සහ ලේබල් කරන ලද සත්ව විශේෂයන් ඇල්ලීම,ගොඩබෑම, ප්‍රවාහනය, වෙනත් යාත්‍රාවකට මාරු කිරීම, ලබා ගැනීම, සන්තකයේ තබාගැනී බෝට්ටුවමගින් **නොකළ යුතුය.**

- මසුන් ඇල්ලීමට භාවිතා කරන කරමැල් දැල්වල දිග කි: මී 2.5 වැඩි**නොවිය යුතුය.**

- ජාත්‍යාන්තර මුහුදේ සවිකර ඇති දත්ත බෝයා වලින් නාවික සැතපුමක අරය තුළ ධීවර මෙහෙයුම් කිරීමත් ඒවාට අලාභ හානි කිරීමත් **නොකළ යුතුය.**

- මසුන් ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොමැති අවස්ථාවලදී, එක්කෝ ටූනා මසුන් (ඇස් ගෙඩි කෙලවල්ලා, බලයා හා කහ වරල කෙලවල්ලා) හැකි ඉක්මනින් පණපිටින් මුදා හැරිය යුතුය යන්න හා එසේ මුදා හැරි පසු ආපසු වරායටලඟා වනතෙක්එම මසුන් ඇල්ලීම **නොකළ යුතුය.**

## 4.0 නීතිඋල්ලංගනයහාදඬුවම්

- මෙහෙයුම් බල පත්‍රයක් නොමැතිවමහ **මුහුදේ ධීවර මෙහෙයුමක** යෙදුනහොත් දඬුවම 1,500,000 (ලක්ෂ පහළොවක්) කට අඩු නොවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි බන්ධනාගාර ගත කිරීම

- වෙනත් රටක ජල තීරයක මසුන් ඇල්ලුවොත් රු. 1,500,000 (ලක්ෂ පහළොවක්) දඩයක් හෝ වසර 2කට නොවැඩි සිර දඬුවම්

- බලපත්‍රය බෝට්ටුවේ රැගෙන නොගියොත් රු. 25000 නොවැඩි දඩයක්

## 4.1 යාත්‍රාවේ දිග අනුව දඬුවම

| බෝට්ටුවේ දිග | දඩ මුදල |
|---|---|
| **මීටර් 10.30 – 15 ( අඩි 34 – 50 අතර )** | රු. ලක්ෂ 15 |
| **මීටර් 15 – 24 ( අඩි 50 – 78 අතර )** | රු. ලක්ෂ 50 |
| **මීටර් 24 - 45 ( අඩි 78 – 147 අතර )** | රු. ලක්ෂ 750 |
| **මීටර් 45 – 75 ( අඩි 147 – 246 අතර )** | රු. ලක්ෂ 1200 |
| **මීටර් 75 ට වැඩි ( අඩි 246 ට වැඩි )** | රු ලක්ෂ 1500 |

- ධීවර යාත්‍රාව ලියාපදිංචි නොකිරීම
- ලියා පදිංචි අංකය සටහන් නොකිරීම හෝ වැරදි අංකයක් සටහන් කිරීම
- දත්ත සටහන් ලොග් පොත රැගෙන නොයාම/ රැගෙන ගියත් නඩත්තු නොකිරීම
- ලියා පදිංචි සහතික පොත හෝ සහතික කරන ක ලද සටහන් රැගෙන නොයාම
- මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා වන මෙහෙයුම් බලපත්‍රය යාත්‍රාවේ රැගෙන නොයාම
- ධීවර යාත්‍රාවේ ආම්පන්න නිසි පරිදි සලකුණු නොකිරීම
- තහනම් මත්ස්‍ය විශේෂ මුහුදු මගින් (කසමෝරා වැනි) ඇල්ලීම ප්‍රවාහනය
- VMS භාවිතා නොකිරීම හා උපරිම දිග කි.මි. 2.5 ට වැඩි දැල් භාවිතා කිරීම

රු. 25000 දඩයක්

ඉන්දියානු සාගර ටූනා කොමිසම /එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග පිළිබඳ සම්මුතිය/එක්සත් ජාතීන්ගේ සාගර නීති පිළිබද සම්මුතිය හා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සම්මුතීන් යටතේ පනවා ඇති රෙගුලාසි කඩ කිරීම සම්බන්ධයෙන් රුපියල් මිලියනයක් දක්වා දඩයක් හෝ වසර 02ක සිර දඬුවමක් සහ යාත්‍රාව රාජසන්තක කිරීම.

## 5.0 විශේෂ අනතුරු හැඟවීමක්

වෙනත් රාජ්‍යයකට අයත් හෝ රක්ෂණය කළ ජල තීරයක මසුන් **ඇල්ලීම සපුරා** තහනම්. විශේෂයෙන්ම දියාගෝ-ග්‍රාසියා දූපත් ආශ්‍රිත බ්‍රිතාන්‍යයට අයත් ඉන්දියන් සාගර අනන්‍යය ආර්ථික කලාපය (BIOT) තුළ ධීවර මෙහෙයුම් සිදුකිරීම මසුන් හෝ වෙනත් ද්‍රව්‍ය හුවමාරුව හා කඳවුරු පිහිටුවීමට කිසිදු අවසරයක් නොමැත.මෙම වරදට අදාල දඩුවම් මෙසේය.

1. සිර දඩුවම්
2. රු.99,373,500(බ්‍රි: පවුම් 500,000) ක දඩ මුදල්
3. ධීවර ආම්පන්න හා අල්ලා ගත් මාළු රාජ සන්තක වීම.මෙම නීතිවිරෝධි කටයුතු නිසා අදාල ධීවරයන්ට හා ඔවුන්ගේ පවුල්වල වන හිරිහැර හා දඩුවම් වලට අමතරව, ශ්‍රී ලංකා ධීවර කර්මාන්තයට හා , මසුන් අපනයනයට මරු පහරක් වැදීමට අමතරව, ශ්‍රී ලංකාව ජාත්‍යාන්තරය තුළ මහත් අපකීර්තියට පත්වනු ඇත.

## 6.0 මහ මුහුදේ ධීවර කටයුතු කළමනාකරණය සඳහා යොදා ගන්නා ප්‍රධාන මෙවලම්

මහ මුහුදේ (ජාත්‍යාන්තර මුහුදේ) ධීවර කටයුතු කළමණාකරණය කිරීම සඳහා ධීවර සම්පත් දෙපාර්තමේන්තුව විධි අතර ධීවර දත්ත සටහන් පොත (ලොග් පොත) යාත්‍රා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය හා යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (VMS) ප්‍රධාන වේ.

## 6.1 ධීවර දත්ත සටහන් පොත - Log Book

ධීවර හා ජලජ සම්පත් පනත යටතේ2012 අප්‍රේල් 25 දිනැති අංක 1755/ 32 දරණ ගැසට් නිවේදනයෙන් ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි මගින් සියලුම යාන්ත්‍රික බෝට්ටු අනිවාර්යෙන්ම ධීවර දත්ත සටහන් පොතක් (ලොග් පොතක්) පවත්වාගෙන යා යුතුය. මෙයට අනුකූල නොවන යාත්‍රා හිමියන් නඩු විභාගයකින් පසුව රු. 25000 කට නොවැඩි දඩයක් ගෙවිය යුතුවේ. ධීවර මෙහෙයුම් බලපත්‍රයක් ලබා ගන්නා අවස්ථාවේදීම ලොග් පොතක් ලබා ගැනීමට යාත්‍රා හිමිකරු බැඳීසිටී.

### ධීවර දත්ත සටහන් පොත හෝ ලොග් පොතක් යනු කුමක් ද?

ලොග් පොතක් යනු යම් කාල වකවානුවක් තුල හා කිසියම් ප්‍රදේශයකින් අල්ලා ගන්නා මත්ස්‍ය වර්ග හා ප්‍රමාණයන් (කි. ග්‍රෑම්) එක් එක් මුහුදු ගමනකට අදාලව වාර්තාගත කරන දත්ත සටහන් පොතකි.

**එහි අඩංගු තොරතුරු මොනවා ද?**

එම තොරතුරු වනුයේ මසුන් ඇල්ලූ ස්ථානය ,ඇල්ලූ වේලාව ,කුමන ස්ථානයේද? මසුන් අල්ලා ගත් පන්නය, අල්ලාගත් මසුන් වර්ග හා ප්‍රමාණයන් ,මුහුදු ගමන සඳහා ගතවූ කාලය යනාදියයි.

**ලොග් පොතක් මගින් මෙම දත්ත රැස්කිරීම අවශ්‍යවන්නේ මක්නිසා ද?**

සාගරයේ මත්ස්‍ය සම්පත් අසීමිත යැයි අතීතයේ දී විශ්වාසයක් පැවතුනද එය මිථ්‍යාවක් බව තහවුරු වී ඇත. එම නිසා අනාගත පරම්පරාවටත් භාවිත කල හැකි අන්දමට ( තිරසාරීපදනමකින්) මත්ස්‍ය සම්පත නෙලාගත යුතු වේ. මේ සඳහා මත්ස්‍ය සම්පත් පිළිබඳ තොරතුරු කාලීනව ලබාගැනීම ධීවර කටයුතු මනාව කළමනාකරණයට අත්‍යවශ්‍ය වේ. ධීවර දත්ත සටහන් හෙවත් ලොග් පොත් මගින් කෙරෙනුයේ එම කළමනාකරණයට අවශ්‍ය දත්ත ලබාගැනීමට දායකත්වයක් ලබාදීමයි.

**ලොග් පොතෙන් ලබාගන්නා දත්ත කළමනාකරණයට යොදා ගන්නේ කෙසේ ද?**

- ❖ සෑම මුහුදු ගමනකින් පසුව නිවැරදිව සම්පූර්ණකර ලොග් පොත් පත්‍රිකා නියමුවා / කප්පිත්තා තම අත්සන යොදා බලයලත් නිලධාරී වෙත ( ධීවර වරාය කළමණාකරු / ධීවර පරීක්ෂක / ධීවර සම්පත් කළමණාකාර සහකාර ) භාරදිය යුතුය.
- ❖ ලොග් සටහන භාරගන්නා නිලධාරී එය පරීක්ෂා කොට, සහතික කොට ධීවර සහකාර අධ්‍යක්ෂ වෙත භාරදිය යුතුය.

- සහකාර අධ්‍යක්ෂ එකතුකල සියලුම දත්ත සටහන් පත්‍ර / ලොග් පොත් ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යන් කළමණාකරණ අංශය වෙත යවනු ලැබේ.
- කළමණාකරණ අංශය එම දත්ත පරිගණක කොට විවිධ කළමණාකරණ කටයුතු සඳහා යොදා ගැනීමට සලස්වයි.




**ලොග් පොත පිළිබඳව ධීවර ජනතාවගේ වගකීම**

ධීවර කළමණාකරණයට අත්‍යාවශ්‍ය තොරතුරු අන්තර්ගත කළ යුතු මෙම දත්ත සටහන නියමිත පරිදිසම්පූර්ණ කොට භාරදීම සෑම ධීවර මහතකුගේම නෛතික වගකීමක් මෙන්ම උත්තරීතර යුතුකමක්ද වේ.මේ පිළිබඳ ධීවර යාත්‍රා හිමිකරුවන්, නියමුවන්, යාත්‍රා ගැණියන් යන සියලුදෙනාම දැනුවත්වී දත්ත සටහන් නියමිත පරිදි පවත්වාගෙන බලයලත් නිලධාරීන්ට භාරදිය යුතු වේ.

## 6.2 යාත්‍රා පරීක්ෂණ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා ධීවර යාත්‍රා මගින් නීති විරෝධී, වාර්තා නොකරණ හා අවිධිමත් ධීවර කටයුතු (IUU) සිදු නොකෙරෙන බවට සුපරීක්ෂාකාරී වීමට සහ සහතික වීමටයොදා ගන්නා වැදගත් මෙවලමක් වන්නේ ධීවර යාත්රා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියයි

මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ධීවර යාත්‍රා මගින් කෙරෙන සියලු ධීවර මෙහෙයුම් නීතියට අනුකූලව සිදුවන්නේ දැයි සොයා බැලීම හා නීති උල්ලංඝනය කරන්නවුන් හදුනාගෙන ඒ සඳහා දඩුවම් පැනවීමයි. මෙම යාත්‍රා පරීක්ෂණ කටයුතු ධීවර දෙපාර්තමේන්තුවේ වගකීම වන අතර, එම පරීක්ෂණ ධීවර පරීක්ෂකවරු විසින් නාවික හමුදාව, වෙරළ ආරක්ෂක බලකාය හා ධීවර වරාය නීතිගත සංස්ථාව යන ආයතනවල නිලධාරීන්ගේ සහය ඇතිව ධීවර පනතේ ප්‍රතිපාදන යටතේ සිදු කෙරේ. මෙම යාත්‍රා පරීක්ෂණ අධියර තුනකින් සිදු කෙරේ.

I. ධීවර කටයුතු සඳහා පිටත් වීමට පෙර කෙරෙන පරීක්ෂණ - සියලුම ධීවර යාත්‍රා මුහුදු ගමන් ඇරඹීමට පෙර අදාළ ධීවර වරායේ කළමණාකරු වෙත වාර්තා කළ යුතු අතර, ඒ සඳහා අවසර දීමට පෙර යාත්‍රා පරීක්ෂා කෙරේ. එහිදි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ යාත්‍රාව ලියාපදිංචි කොට තිබේද? කප්පිත්තාට අදාළ සහතිකය තිබේද? ධීවර මෙහෙයුම් බල පත්‍රයක් ලබාගෙන ඇද්ද, යාත්‍රා අංකය, ඇමතුම් සංකේතය, ආම්පන්න සලකුණු කිරීම යනාදිය සපුරා ඇද්ද, (VMS) උපකරණ, SSB RADIO ව,ජීවිත ආරක්ෂක කට්ටල හා බිලිකටු ඉවත් කිරීමේ හා මරුවැල් කැපීමේ උපකරණ

යාත්‍රාවේ තිබේද, ගෙන යන දැල් ප්‍රමාණය කි:මි 2.5 දිගට වඩා වැඩි ද යන කරුණුයි.

II. මුහුදේ දී කෙරෙන පරීක්ෂණ - සැක කටයුතු යැයි විශ්වාස කෙරෙන ඕනෑම අවස්ථාවක දී මුහුදේ දී ධීවර යාත්‍රා පරීක්ෂා කිරීමේ බලය ධීවර පරීක්ෂක මහතුන්ට හෝ නාවික හා වෙරල රක්ෂක බලකායේ නිලධාරීන් සතුවේ.



III. ධීවර මෙහෙයුම් අවසන් කොට වරායට ආපසු ආවිට කෙරෙන යාත්‍රා පරීක්ෂණය - මෙමගින්අපේක්ෂා කෙරෙන්නේ යාත්‍රා මගින් සිදුකරන ලද කටයුතු වලනිත්‍යානුකූල බව පරීක්ෂා කිරීමයි. මෙහිදි පළමුවන අධියර යටතේ සඳයන් කළ කරුණුවලට අමතරව අල්ලාගත් මසුන්, එම මසුන් වර්ග, අල්ලාගත් ස්ථානය පිළිබඳදත්ත (LOG) පොත් ඇසුරෙන් පරීක්ෂා කිරීම, තහනම් මත්ස්‍ය වර්ග ධීවර යාත්‍රාවේ ඇද්ද, VMSඋපකරණ අවභාවිතා කොට ඇද්ද යනාදිය පරීක්ෂා කරන අතර එම පරීක්ෂණ වාර්තාව කප්පිත්තා වෙත යොමු කොට ඔහුගේ විමර්ශන ලබා ගෙන ධීවර කළමණාකරන අංශ වෙත යොමු කරන අතර සිදුකළ උල්ලංගනයන් සඳහා නඩු පැවරීම හෝ දඩුවම් කිරීමට කටයුතු කෙරෙනු ඇත.

## 6.3 යාත්‍රා නිරික්ෂන පද්ධතිය - Vessel Monitoring System (VMS)


ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ජාත්‍යන්තරව පිළිගැනීමකට ලක් කිරිමට නම් අන්තර්ජාතික ප්‍රමිතින්ට අනුව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය අධීක්ෂණය සිදුවන වාදැයි යුතුවේ. එහිදි වඩාත් වැදගත් වන්නේ නීති විරෝධී, වාර්තා නොකරන හා අවිධිමත් ධීවර කටයුතුවල(IUU fishing) නොයෙදීම හා එය අධීක්ෂණය සඳහා පිළිගත් අධීක්ෂණ, පාලන හා සෝදිසි මෙහෙයුම් (Monitoring Control and Surveillance – MCS) වැඩ පිළිවෙලක් තිබීම වේ.

මේ යටතේ ධීවර යාත්‍රා තම ධීවර කටයුතු සිදුකරනස්ථානය, කාලවේලාවන් හා ගමන් මාර්ගයන් හඳුනා ගත හැකි පිළිගත් තාක්ෂණ ක්‍රම වේදයක් මගින් හඳුනා ගත යුතුවේ. මේ සඳහා සුදුසුම ක්‍රියාමාර්ගය වන්නේ චන්ද්‍රිකා තාක්ෂණය හා පරිගණක පද්ධති උපයෝගි කරගන්නා යාත්‍රා නිරික්ෂන පද්ධතියක් (VMS) ක්‍රියාත්මක කිරිමයි.

ඒ සඳහා මුලික පියවර තබමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් (VMS) ස්ථාපිත කිරිමට කටයුතු යොදා ඇත.

VMS පද්ධතිය මගින් සිදුවන්නේ මුහුදේ ඇති සෑම යාත්‍රාවකටම සවිකොට ඇති ට්‍රාන්ස්පොන්ඩර් නම් උපකරණයක් මගින් චන්ද්‍රිකා හරහා ගොඩබිම ඇති නියමිත ස්ථානයකට දත්ත සවයංක්‍රියව ලබා දිමයි. ධීවර යාත්‍රාවේ ඇති සම්ප්‍රේෂණ උපකරණය මගින් GPS චන්ද්‍රිකාව ඔස්සේ යාත්‍රාව තිබෙන භූගෝලිය ස්ථානය (අක්ෂාංශ හා දේශාංශ මගින්) හදුනාගෙන එම තොරතුරු සන්නිවේදන චන්ද්‍රිකාව හරහා පෘථිවි චන්ද්‍රිකා මධ්‍යස්ථානයත් අධික්ෂණ මධ්‍යස්ථානයත් වෙතසම්ප්‍රේෂණය කෙරේ.

එමගින් යාත්‍රාව තිබෙන ස්ථානය (අක්ෂාංශ හා දේශාංශ), වෙලාව, ගමන් කරන දිශාව, ගමන් කරන වේගය මෙන්ම වැඩිදුර අධීක්ෂණය කලහොත් යම් පන්න ක්‍රමයක් භාවිතා කරන අවස්ථාවක එම පන්න ක්‍රමය පවා හඳුනාගත හැකිවේ.




යාත්‍රා නිරික්ෂන පද්ධතියක ක්‍රියාකාරිත්වය

මෙමගින් ගමන් ආරම්භ කල අවස්ථාවේ සිට අවසානය දක්වාම යාත්‍රාවේ ගමන් මාර්ගය, දිශාවන්, වේගය, කාලය හා අක්ෂාංශ දේශාංශ නිවැරදිව යාත්‍රාවට පමණක් නොව ගොඩබිමට ද දැනගැනීමට අවස්ථාව ලැබීමෙන් යාත්‍රාව ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාවට අයත් මුහුදේ ද, ජාත්‍යාන්තර මුහුදේ ද එසේත් නැතිනම් වෙනත් රටක අනන්‍ය ආර්ථික කලාපයකද යන්න බලධාරීන්ට ගොඩබිම සිට නිවැරදිව හඳුනා ගත හැකිවේ.

එමෙන්ම VMS පද්ධතියක් තිබීම යාත්‍රාවක ආරක්ෂාව සම්බන්ධයෙන්ද ඉතා වැදගත් වේ. මහ මුහුදේ සිදුවිය හැකි අනතුරක් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාව මෙන්ම එවැනි අනතුරක් සිදුවූ ස්ථානය නිවැරදිව ලබා ගැනීමේ හැකියාව ලැබේ. එමෙන්ම යාත්‍රා හිමියන්ට තම යාත්‍රා පිළිබඳ නියමුවන් ලබා දෙන තොරතුරු මතම නොසිට මුහුදේ ඇති යාත්‍රාවේ තොරතුරු යත්‍රා හිමියාටම ගොඩබිම සිට තොරතුරු ලබාගැනීමේ හැකියාව ලැබේ.

අනන්‍ය ආර්ථික කලාපයේ හා මහ මුහුදේ ධීවර හා ජලජ සම්පත් විභවයන් තක්සේරු කිරිමේදී වැදගත් දත්තයන් සපයා ගැනීමට VMS මගින් ලබා දෙන තොරතුරු ඉතා වැදගත්වේ. චන්ද්‍රිකා තාක්ෂණය මගින් නිවැරදි තොරතුරු නිසිවෙලාවට නියමිත කාල පරාසයක් තුල අදාල පර්යේෂකයන් වෙත ලබා ගැනිමේ හැකියාව ලැබේ. එමගින් මත්ස්‍ය බිම් හදුනාගැනිමේ හැකියාව ලැබේ. එනම් මත්ස්‍ය තොග ගණනයේදි මෙම නිසිවෙලාවට ලබාගතහැකි නිවැරදි දත්තයන් තිබීම ඉතා වැදගත්වේ.



තවද ජාතික මට්ටමින් ධීවර කළමණාකරනයට අවශ්‍ය වැදගත් දත්තයක් වන සක්‍රිය යාත්‍රා ප්‍රමාණයක් (Active vessels) කිනම් ප්‍රදේශයක කුමන වර්ගයකින් කොපමණ ආම්පන්න ප්‍රමාණයක් භාවිතා කරන්නේදැයි VMS පද්ධතියක් මගින් දැනගත හැකිවේ. එසේම යම් තහනම් මුහුදු කලාපයක හෝ සංරක්ෂිත මුහුදු කලාපයක යම් ධීවර මෙහෙයුමක් කරන්නේද යන්න දැනගැනීමේ හැකියාවද ලැබේ.

කළමනාකරණයේ වැදගත් සාධකයක් වන මත්ස්‍ය නිෂ්පාදනය ගණනය කිරිමේදී VMS පද්ධතිය ඍජුවම යොදාගත හැකි අවස්ථා ඇත. එසේ නොවුනද යාත්‍රා නියමුවන් විසින් පවත්වාගෙන යනු ලබන ලොග් සටහන් සමග VMS දත්තයන් සන්සන්දනය කිරිමෙන් කළමනාකරණය සඳහා උපයෝගී කරගනු ලබන තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කර ගත හැකිවේ.

කළමණාකරන තීරණ ගැනීමේදී යාත්‍රා හිමිකරුවන්/නියමුවන් විසින් ලබා දෙන ලද තොරුතුරු සම්බන්ධයෙන් පවතින අවිශ්වාසයන් VMS පද්ධතියක් මගින් නිවැරදි කරගැනිම හෝ සත්‍ය තොරතුරු එකවර ලබා ගැනිමේ හැකියාව ලැබීමෙන් ධීවර සම්පත් කළමනාකරුවන්ට හෝ කළමනාකරණ ආයතනයන්ට ඉතා වැදගත් අවස්ථාවක් උදාවේ. යාත්‍රා හිමිකරුවන් / නියමුවන් දැනුවත් හෝ නොදැනුවත්ව ලබා දෙන ඇතැම් තොරුතුරු මත යැපීමට සිදුවූ කළමනාකරුවන් ට VMS පද්ධතියක් මගින් නිවැරදි දත්ත ලබාගැනීමට හැකියාව ලැබේ.

## 7.0

# ජාත්‍යාන්තර මුහුදේ ධීවර කටයුතු වල යෙදීමේදී පිළිපැදිය යුතු මූලික කරුණු සැකෙවින්

## පිටත්වීමට පෙර

බලපත්‍ර හා ලියාපදිංචි ලේඛණ, ලොග්පොත්, ආම්පන්න සලකුණු කිරීමේ පුවරු, VMS උපකරණය, ඉලක්ක නොකරන සතුන් මුදහරින උපකරණ සූදානම් කර ගැනීම

යාත්‍රාව, රැගෙන යන උපකරණ, ලේඛණ හා ආම්පන්න පිළිබඳ විස්තරය අදාල නිලධාරියාට භාරදීම

එම විස්තර පිළිබඳව දත්ත ගබඩාවක් ධීවර කාර්යාලයේ පවත්වාගෙන මාසිකව ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම

## මුහුදේදී

දිනපතා හසුවන මසුන් හා නිදහස් කල ඉලක්ක නොකරන සතුන් පිළිබඳව දහවල් 12ට යත්‍රාව පිහිටි ස්ථානයේ GPS දත්තද අතුලත්ව ලොග්පොතේ සඳහන් කිරීම.

දෙපාර්තමේන්තුවේ MCS ඒකකය VMS පද්ධතිය මගින් යාත්‍රාවේ ගමන් මග නිරීක්ෂණය කරනු ඇත.

මීටර් 24ට වඩා වැඩි යාත්‍රා වල නිරීක්ෂකයින් යෙදවීම

## නැවත පැමිණීමේදී

යාත්‍රාව ගොඩබිමට කි.මී.50 පමණ දුරින් පිහිටියදී එම යාත්‍රව පරීක්ෂා කිරීමේ පණිවිඩය ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් ධීවර කාර්යාලයට ලබා දේ

යාත්‍රාව ගොඩබිමට පැමිණි පසු ධීවර නිලධාරියා යාත්‍රාව පරීක්ෂා කරනු ඇත

ලොග් පිටපත හා යාත්‍රාවේ විස්තර අතුලත් වාර්තාව ධීවර නිලධාරියාට භාරදිය යුතුය

ලොග් පිටපතේ සහතික කල පිටපතක් ධීවර නිලධාරියා විසින් අපනයන සහතිකවල කටයුතු සඳහා නැවත භාර දෙනු ඇත.

ලොග් පිටපතක් ප්‍රධාන කර්යාලයට යොමු කෙරේ

එම ලොග් පිටපත හා VMS දත්ත ප්‍රධාන කාර්යාලයේදී සසඳා බලනු ඇත.

ධීවර කාර්මික මහතුන් විසින් කලයුතු හා සහාය ලබා දියයුතු කරුණු ☐ ලෙස දක්වා ඇත.

# ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ජාත්‍යන්තර ධීවර කටයුතු පිළිබඳ ඒකකයේ පණිවිඩයකි

වැඩි විස්තර සඳහා:

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමා | 011 2 449 170 |
| අධ්‍යක්ෂ(කළමණාකරන) | 011 2 446 291 |
| අධ්‍යක්ෂ (කර්මාන්ත) | 011 2 472 199 |
| ප්‍රධාන කාර්යාලය | 011 2 446 183 |

දිස්ත්‍රික් කාර්යාල

| | |
|---|---|
| කොළඹ | 011 2 716 868 |
| කළුතර | 034 2 222 482 |
| ගාල්ල | 091 2 234 908 |
| මාතර | 041 2 222 010 |
| තංගල්ල | 047 2 240 208 |
| අම්පාර | 067 2 229 363 |
| මඩකලපුව | 065 2 224 472 |
| ත්‍රිකුණාමලය | 065 2 224 472 |
| මුලතිවු | 024 3 248 599 |
| කිලිනොච්චි | 021 2 285 964 |
| යාපනය | 021 2 222 532 |
| මන්නාරම | 023 2 222 173 |
| පුත්තලම | 032 2 265 295 |
| හලාවත | 032 2 254 279 |
| මීගමුව | 031 2 222 431 |